# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ශේෂ පත්‍ර දිනට වාහන වල ඉදිරියට ගෙන යන අගය සහ ඒවායේ සාධාරණ අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොමැති බව තහවුරු කර ගැනීමට මණ්ඩලය වාහන ප්‍රත්‍යාගණනයක් කර නොතිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වසර 2 කට වැඩි කාලයක් ගත වී ඇතත් නිරවුල් නොකරන ලද ගෙවිය යුතු හිඟහිටි ශේෂය රු. 966,184 කි.

(ආ) මණ්ඩලයේ නිලධාරීන්ට නිරවුල් කළයුතු වසරක් ඉක්මවන ලද රු. 50,953 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද නිරවුල් කර නොතිබුණි.

(ඇ) රු. 50,681 ක් වූ විශේෂ ණය, රු. 10,600 ක් වූ උත්සව අත්තිකාරම්, රු. 7,700 ක් වූ උත්සව අත්තිකාරම් ණය, රු. 22,000 ක් වූ විශේෂ අත්තිකාරම් ණය, රු. 399,282 ක් ව වාහන ණය හා රු. 449,486 ක් වූ ආපදාණය යන ශේෂයන්ගේ එකතුව රු. 939,749 ක් ණය හිමියාගෙන් හෝ අදාල ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) SMIB නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2011 ජනවාරි 01 දිනට ලබා දී තිබුණු එකතුව රු. 214,264 ක් වූ ණය ශේෂ සඳහා සමාලෝචිත වර්ෂයේ දී කිසිදු වාරික මුදලක් ලැබී නොතිබුණි.

(ඉ) බැරකම් යටතේ දැක්වෙන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ගිණුමේ රු. 7,017,309 ක් වූ ශේෂය 1995 සිට ද, ආපසු ගෙවන ප්‍රතිලාභ ගිණුමේ රු. 11,749,478 ක් වූ ශේෂය 2001 සට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ද අඛණ්ඩව වැඩි වී ඇති නමුත්, එම ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) 2001 වර්ෂයේ සිට වැඩිවෙමින් පැවති ආපසු ගෙවන ප්‍රතිලාභ ගිණුමේ රු. 4,575,055 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) සේවයෙන් ඉවත් වී වසර 1 සිට වසර 12 දක්වා වූ කාලයක් ගත වී ඇති, නිලධාරීන් 22 ක ගෙන් තවදුරටත් අයකර ගත යුතු අයවීම් රු. 385,290 ක් 2011 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සාක්ෂි නොමැතිව සුළු මුදලින් ගෙවීම් කරන ලද වව්චර් 180 ක වටිනාකම රු.238,974 කි.

**1.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි යනාදයට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පර්පාලන චක්‍රලේඛය 1.1.6 වගන්තිය හා 2.3 වගන්තිය. | මෙම වගන්ති වලට පටහැනිව ආයතනයේ නිලධාරීන්ගේ පෞද්ගලික ගමන් සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී වැයකර ඇති ඉන්ධන වියදම රු. 2,317,396 ක් විය. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 50 හා 2008 ජුලි 28 දිනැති චක්‍රලේඛය 01 ඡේදය | චක්‍රලේඛයේ දක්වා ඇති අනුමත ඉන්ධන දීමනාව ඉක්මවා නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරා ඇති ඉන්ධන වියදම රු. 871,242 ක් විය. |

| | |
|---|---|
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 130 හා 1998 මාර්තු 18 දිනැති චක්‍රලේඛය, අංක 26/47 හා 1997 නොවැම්බර් 19 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ 2011 ඔක්. 18 පැවැති 56 කාරක සභා රැස්වීමේ සටහනේ 19 වගන්තිය | 4.2% වන සේවක ණය පොළී අනුපාතය මත සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සඳහා ණය ලබා නොදිය යුතු බව සඳහන් කර තිබුණ ද, මණ්ඩලය ඊට පටහැනි ලෙස කටයුතු කරමින් ඉහත පොළී අනුපාතයට හා ඊට අඩු පොළී අනුපාත යටතේ සේවක ණය ලබා දී තිබුණි. 2011 දෙසැම්බර් 31 වන විට ඉහත පොළී අනුපාතයන් මත ලබා දුන් රු. 338,938,974 ක ණය ශේෂයක් අයවීමට තිබුණි. |
| (ඈ) අංක පීඊඩී 12 හා 2003 ජුනි 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 8.3.8 වගන්තය | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව රු. 853,440 ක පරිත්‍යාග සිදුකර තිබුණි. |
| (ii) 8.7 වගන්තිය | නිලධාරින්ගේ සේවා නියුක්ති ආදායම මත අයකරගත යුතු බදු සේවායෝජක විසින් නොදැරිය යුතු වුවත්, වර්ෂය තුළ රු. 3,429,042 ක උපයන විට ගෙවීම් බදු මණ්ඩලය විසින් දරා තිබුණි. |
| (iii) 9.12 වගන්තිය | මණ්ඩලය විසින් හඳුන්වාදෙන සුභසාධන වැඩසටහන් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබානොගත් සුභසාධන ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 18,353,944 ක වියදමක් දරා තිබුණි. |
| (ඉ) අංක පීඑෆ්/පීඊ 5 හා 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ 2011 ඔක්. 18 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ අංක 56 කාරක සභා රැස්වීමේ සටහනේ 16 වගන්තිය | මහා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව දිරිගැන්වීමේ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 74,845,611 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඊ) අංක 47 හා 2011 දෙසැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය | මෙම චක්‍රලේඛයේ 1 හා 2 වගන්ති වලට පටහැනි වන පරිදි සමාලෝචිත වර්ෂයේ දී රු. 44,482,478 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. 8 වන වගන්තිය පරිදි චක්‍රලේඛයේ විධිවිධාන |

| | |
|---|---|
| | වලට පර්බාහිරව ප්‍රසාද දීමනා ගෙවන්නේ නම් අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (උ) අංක 30 හා 2010 සැප්තැම්බර් මස 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය ඇමුණුම II (6) ජේදය | වැටුප් වර්ධකයේ මූල්‍ය අගය අඩුවීමේ වෙනස ගැලපීම් කර ඉදිරියට ලබාදීම වෙනුවට පැරණි වැටුප් ක්‍රමය යටතේ වැටුප් වර්ධක ලබාගත් කාල සීමාවට ද එම අඩුවීම ගණනය කර අතීතයට බලපාන පරිදි වැටුප් වර්ධක ගැලපීම සිදුකර තිබීම 2012 මාර්තු 31 දින වන විටත් නිවැරදි කර නොතිබුණි. |
| (ඌ) අංක 2005/12 හා 2005 ජුලි 25 දිනැති පර්පාලන හා මානව සම්පත් කොට්ඨාශ චක්‍රලේඛය 03 වගන්තිය xiv ජේදය | කලින් ලබාගත් ණය මුදල සම්පූර්ණයෙන්ම නොගෙවන්නේ නම් එම ණය මුදලේ ශේෂය අඩුකර ඉතිරි මුදල ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව කටයුතු කළ අවස්ථාවක් නිරීක්ෂණය විය. |
| (එ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ) | |
| (i) මු.රෙ. 104 | වාහන අනතුරු 45 ක් සම්බන්ධයෙන් වූ අලාභ හානි පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 756(1) | ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් වල වටිනාකම හා සැසඳෙන පරිදි විධිමත් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

**1.2.5 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 1999 සිට ක්‍රියාත්මක කරන මූල්‍ය කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මුදල් අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන මණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් 1993 වර්ෂයේ සිට නිල ඇඳුම් ලබා දීම සිදුකර තිබුණු අතර, මේ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 8,709,039 ක වියදමක් දරා තිබුණි.

(ඇ) සෙනසුරාදා සහ ඉරිදා දිනයන් වෙනුවෙන් අතිකාල සඳහා පැයකට පැය එකහමාරක දීමනාවක් හා එම දිනයන්හි දී පැය 08 ක් සම්පූර්ණ වීමත් සමගම දිනක වැටුපක් ද එකතු කර අනුමැතියකින් හා පදනමකින් තොරව ගෙවනු ලබන අතිකාල දීමනා රු. 14,092,107 ක් වූ අතිකාල දීමනා තුල අන්තර්ගත වී තිබුණි.

2 **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 11,570,693,989 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 14,588,421,261 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ අඩුවීම රු. 3,017,727,272 ක් විය. 2011 වර්ෂයේ දී ආයෝජන මත ලැබුණු ආයෝජන ආදායම හා කොටස් ප්‍රාග්ධනය විකිණීමේ ප්‍රාග්ධන ලාභ අඩුවීම මෙන්ම පරිපාලන වියදම් ඉහල යාම ද මෙම අතිරික්තයේ අඩුවීමට හේතු වී තිබුණි.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) පෙර වර්ෂ හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයෙ අතිරික්තය අඩුවීම හේතුවෙන් සාමාජිකයන් වෙත ලබාදෙන ලද ලාභාංශ ප්‍රතිශතය 2.5 % කින් අඩු වී තිබුණි.

(ආ) **<u>අරමුදලේ සාමාජිකයන්ගේ හිමිකම, මුළු දායක මුදල හා ප්‍රකාශිත පොලියේ සමුච්චිත අගයේ වර්ෂ 5 තුල විචලන</u>**

පසුගිය වර්ෂ 05 ක් තුල මණ්ඩලයේ සමාජිකයන්ගේ මුළු හිමිකම හා එම හිමිකම් වලට අයත් මුළු දායක මුදල් හා සමුච්චිත පොළී ලෙස බෙදී ගිය ආකාරය පහත දැක්වේ.

| වර්ෂය | මුළු දායක මුදල | සමුච්චිත පොලිය | සමාජිකයන්ගේ හිමිකම |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2007 | 36,798.97 | 39,134.10 | 75,933.07 |
| 2008 | 40,712.25 | 48,157.80 | 88,870.05 |
| 2009 | 43,875.10 | 59,181.98 | 103,057.08 |
| 2010 | 48,148.28 | 71,704.59 | 119,852.87 |
| 2011 | 51,464.77 | 84,021.53 | 135,486.30 |

ඉහත තොරතුරු අනුව 2011 වර්ෂය වන විට මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකමින් 38% ක් දායක මුදල්ව තිබූ අතර, 62% ක් සමුච්චිත පොලිය වී තිබුණි. එමෙන්ම 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී සාමාජිකයන්ගේ මුළු හිමිකම 13% කින් වර්ධනය වී තිබුණු නමුත් එකී වර්ෂයේදී මුළු දායක මුදල වර්ධනය වී තිබුණේ 6.9% කින් පමණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 මෙහෙයුම් කාර්යසාධනය

2011 වර්ෂය අවසානයේ කාර්ය සාධන තත්ත්වය පහත පරිදි විය.

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාරිත්වයට අදාල වූ සංඛ්‍යා | එහි ප්‍රතිශතයන් |
|---|---|---|---|
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය | 3,414,944 | 2,100,000 | 61.49% |
| සේවා යෝජකයින් | 228,926 | 67,041 | 29.28% |
| අරමුදලේ සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 9.6 | 2.1 | 21.87% |

2011 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ස්වයං රැකියාලාභීන් 2,478,716 ක් අරමුදලට බඳවාගෙන සහන සැලසීමේ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලයෙන් සැකසී නොතිබුණි.
(මූලාශ්‍රය 2011 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව.)

3.1.2 **<u>අයෝජන හා ආයෝජන ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.මිලියන 118,984 ක් වූ ආයෝජන, මිලදී ගැනීම් සහ කල්පිරීම් ගැලපීමෙන් පසුව වර්ෂය අවසාන ශේෂය රු.මිලියන 134,991 ක් දක්වා වැඩිවී තිබුණි.

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **<u>කෙටිකාලීන රීපෝ ආයෝජන</u>**

එක්තරා බැංකුවක් විසින් මණ්ඩලයට සපයනු ලබන සේවය වෙනුවෙන් මණ්ඩලය බැංකු ගාස්තු ගෙවා තිබියදීත්, 2006 වර්ෂය සිට දෙපාර්ශවයේම එකඟත්වය මත රු. 500,000,000 ක තැන්පතුවක් වෙළඳපොලේ පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයකට අදාල බැංකුව වෙත ලබා දී තිබුණි. වෙළඳපොලේ පොලී අනුපාතය 10% ක් පමණ වේයැයි උපකල්පනය කළ විට එම ආයෝජනයෙන් මණ්ඩලයට නොලැබී ගිය පොලී ආදායම රු. 11,934,162 කට ආසන්න මුදලක් විය.

(ආ) **<u>කොටස් ආයෝජන</u>**

(i) රු. 138,403,316 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 10 කින් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ආදායමක් ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණු අතර, මෙසේ කිසිදු ආයෝජන ආදායමක් නොලැබූ රු. 82,504,091 ක ආයෝජනය කර තිබුණු තවත් සමාගම් 03 ක සමාලෝචිත වර්ෂයේ දී නැවතත් රු. 29,356,835 ක් ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි.

(ii) 624,570 ක් වූ කොටස් වල රු. 25,227,538 ක් ආයෝජිත සමාගම් 2 ක් ඈවරකරණයට ලක් වී තිබුණු අතර, කොටස් 178,700 ක රු. 4,066,314 ක් ආයෝජිත සමාගමක් ලැයිස්තුගත සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කර තිබීම නිසා මණ්ඩලයට එම සමාගම් වල ආයෝජිත මුදල හෝ ප්‍රාග්ධන ලාභ හෝ ලබාගත නොහැකි වී තිබුණි.

(iii) වර්ෂ 2 සිට 5 අතර කාලසීමාවක් තුළදී ප්‍රාග්ධන වෙළඳපොලේ ගනුදෙනු සිදුකර නොමැති සමාගම් 5 ක ආයෝජිත මුදල රු. 152,478,563 ක් විය. මෙහි ඇතුලත් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ කොටස් අනුමැතියකින් තොරව

අලුත් නොකරන ලෙස මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් දී ඇති බව මණ්ඩලයේ සභාපතිවරයාගේ පිළිතුරෙන් දක්වා තිබුණි.

(iv) ඉකුත් වර්ෂය හා සැසදීමේ දී සමාලෝචිත වර්ෂයේ කොටස් හා ඒකක විකිණීමේ ප්‍රාග්ධන ලාභ රු. 654,779,335 කින් අඩු වී තිබුණු අතර, එසේ අඩුවීම ප්‍රතිශතයක් ලෙස 54% ක් විය. 2010 හා 2011 වර්ෂයන්හිදී කොටස් වෙළඳපොළ ශීඝ්‍ර පසුබෑමකට ලක් වී ඇති බවද ඉදිරියේ දී කොටස් මිල ගණන් ඉහල යන අවස්ථා වලදී වැඩි ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට කටයුතු කරන බවද මණ්ඩලයේ සභාපතිවරයාගේ පිළිතුරෙන් දක්වා තිබුණි.

(v) රු. 7,228,104,571 ක් ආයෝජනය කරන ලද ආයතන 105 කින් ආයතන 63 ක කොටස් වල වෙළඳපොළ අගය අඩුවීම වෙනුවෙන් සිදුවිය හැකි අලාභ පිළිබඳව වූ අවිනිශ්චිතාව මත සමාලෝචිත වර්ෂයේ දී සිදුකරන ලද ප්‍රතිපාදනය රු. 911,992,269 ක් විය.

(vi) සමාගම් 02 ක ආයෝජනය කරන ලද ණයකර හා පොරොන්දු නොට්ටු වෙනුවෙන් වර්ෂ 09 කට පෙර සිට ලැබිය යුතු ආයෝජන පොලී රු. 27,854,580 ක් අයකර ගැනීමට මණ්ඩලය 2011 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව අත්තිකාරම් ලබාදීම නිසා මණ්ඩලයේ නිලධාරීන්ට වර්ෂය තුළදී රු. 384,306 ක මුදලක් කෙටිකාලීනව රඳවා ගැනීමට ඉඩකඩ සැලසී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන නමුත්, එමගින් වර්ෂයට අදාල ක්ෂය වටිනාකම වූ රු. 26,210,160 ක එක් එක් අයිතමයන් සඳහා බෙදී ගිය ආකාරය වෙන් වෙන්ව පැහැදිලිව හඳුනාගත නොහැකි විය.

(ඇ) රු. 6,043,707 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ දී එම භාණ්ඩ රජයේ තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කළේ නම් ඒ සඳහා ලැබී ඇතැයි සඳහන් රු. 2,665,709 ක ලාභයට වඩා වැඩි ලාභයක් ලබාගත හැකිව තිබූ බව නිරීක්ෂණය කෙරේ.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

එක්තරා සමාගමකින් මණ්ඩලයට ලැබිය යුතු තැන්පතු ලෙස ගිණුම් වල දැක්වෙන රු. 21,900,000 ක්, මණ්ඩලය විසින් ගිවිසුම් කඩ කිරීමක් මත අධිකරණ නියෝගයකින් අදාල සමාගමට ගෙවන ලද මුදලක් වෙනුවෙන් වූ අභියාචනයක ප්‍රතිඵලයක් ලෙස එම සමාගම විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද බැංකු ඇපකරයක වටිනාකමකි. මෙම කටයුත්තට අදාල අභියාචනය පිළිබඳව, අධිකරණය සමාලෝචිත වර්ෂයේ දී අවසන් නිගමනයකට එළඹ නොතිබුණි.

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) මණ්ඩලයේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා 2011 හා ඊට පෙර වර්ෂයන්හි දී මිලදී ගත් එහෙත් ප්‍රයෝජනයට නොගත් ඉතිරි නිල ඇඳුම් වල වටිනාකම රු. 1,943,500 ක් විය. නිල ඇඳුම් අවශ්‍යතාව පිළිබඳ නිවැරදිව දත්ත එක්රැස් කිරීමකින් තොරව අතිරික්ත තොග මිලදී ගැනීම හේතුවෙන් මෙසේ නිශ්කාර්ය වියදම් දරා තිබුණු බව අනාවරණය වුණි.

(ආ) අවම පිරිවැයක් යටතේ වැඩි ප්‍රතිඵලයක් ලබාගත හැකිවන පරිදි මනා සැලැස්මක් හා අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා 2010 වසරේ උසස් පෙළ සමතුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම පිළිබඳ දැනුම් දීම සඳහා පුවත්පත් දැන්වීම් ගාස්තු ලෙස රු. 1,078,515 ක් වියදම් දරා තිබුණි.

(ඇ) 5 වසර ශිෂත්වය සමත් සිසුන්ට ශිෂත්ව ප්‍රදානය කිරීම සඳහා උත්සවයක් පැවැත්වීමට දැරූ වියදම රු. 1,656,643 ක් විය.

## 3.5 හඳුනාගන්නා ලද පාඩු

කලාප කාර්යාලයක ඇති වූ රු. 11,412 ක් වූ සුළු මුදල් හිඟය ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකිරීම වෙනුවට මණ්ඩලයේ ලාභයෙන් කපා හැර තිබුණු අතර, මණ්ඩලයේ වාහන අංගනයෙන් අයකරගත යුතුව තිබුණු රු. 103,484 ක් ද අයකර ගත නොහැකි වීම නිසා එම මුදල ද පොත් වලින් කපා හැර තිබුණි.

## 3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

අංක පීඊ/ඩී 12 හා 2003 ජුනි 6 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට හා මු.රෙ. 502 (2) 11 පරිශිෂ්ටයේ 9 වන උපලේඛනයට පටහැනිව විධිමත් පවරා දීමකින් තොරව මණ්ඩලයට අයත් රු. 6,189,922 ක් වටිනාකමැති අංක පීබී 1089 දරන කැබ් රථය ජනාධිපති ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණු අතර, සමාලොචිත වර්ෂයේ දී එම වාහනයේ අළුත්වැඩියා හා සේවා කටයුතු වෙනුවෙන් මණ්ඩලය රු. 646,868 ක් වැය කර තිබුණි.

## 3.7 සේවක පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සමාලෝචිත වර්ෂය අවසානයේ දී වූ රු. 179,895,381 ක පාර්තෝෂිත වෙන්කිරීම වෙනම අරමුදලක් ලෙස ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.8 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ වාහන 16 ක් අනතුරු වලට භාජනය වීමෙන් සිදුවූ රු. 606,134 ක අලාභය රක්ෂණයෙන් හෝ එම අනතුරු වලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්ම 2009-2012 කාල පරිච්ඡේදයට අදාල වූ අතර, 2011 වර්ෂයේ ඔක්තෝබර් මාසය වනතෙක් සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2009-2012 සංයුක්ත සැලැස්ම සමගම ක්‍රියාකාර සැලැස්මක් ද ඉදිරිපත් කර තිබුණු අතර, 2011 වර්ෂය අවසාන වන තෙක් වාර්ෂිකව ක්‍රියාකාර සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

අංක ඩීඑම්ඒ/2009 (1) හා 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 04 වගන්තිය, මු.රෙ. 133(2) හා මු.රෙ.134 (3) වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරයන් ඉටු වී නොතිබුණු අතර, අභ්‍යනතර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ද ලබා දී නොතිබුණි.

### 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලය ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5 පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපති වෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.
(ආ) අයවිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්.
(ඇ) පනතට කළ යුතු කාලීන සංශෝධන.
(ඈ) ආයෝජන.